(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 4(9).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා

## 2011 දෙසැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1311/'11

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මගින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා දරන මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා මිල කොපමණද;

(iii) ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබාගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළඹී පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

යන්න විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1335/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය යුද සමයේදී උතුර නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටි හමුදා රණවිරුවන් විශාල කැපකිරීමක් සිදු කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ආබාධිත තත්ත්වයට පත්වීම නිසා වර්ෂ 12 ක සේවා කාලයක් සම්පූර්ණවීමට පෙර වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගොස් සිටින, දුබලතා විශ්‍රාම වැටුප් පමණක් ලබන රණවිරුවන්ට ද වර්ෂ දොළහකට වැඩි සේවා කාලයක් ඇති රණවිරුවන්ට මෙන්ම විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමුකර වර්ෂ දෙකක් ගතවී ඇති බවත්;

(ii) මේ දක්වා එය ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) දුබලතා විශ්‍රාම වැටුප් ලබන රණවිරුවන්ට සේවා විශ්‍රාම වැටුප ගෙවීම ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(ii) කඩිනමින් එම සේවා විශ්‍රාම වැටුප් ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1484/'11

ගරු අජිත් කුමාර මහතා,— පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1598/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් නවය ආවරණය වන පරිදි ක්‍රීඩාංගන නවයක් නවීකරණය කිරීමට හෝ අලුතින් ඉදි කිරීමට සැලසුම් කර තිබේද;

(ii) ඒ සඳහා තෝරාගත් පැරණි ක්‍රීඩාංගන හෝ නව ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම එක් එක් ක්‍රීඩාංගනය සඳහා දැනට පවතින බිම් ප්‍රමාණයට අමතරව අලුතින් ලබා ගැනීමට තීරණය කර ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) ක්‍රීඩාංගන නවීකරණය සඳහා රජයට අයත් නොවන පුද්ගලික ඉඩම් ලබා ගන්නේ නම්, අදාළ ඉඩම් හිමියන්ගේ නම් සහ ඔවුන්ගෙන් ලබා ගන්නා ඉඩම් කොටස්වල තක්සේරු වටිනාකම් කවරේද;

(iii) එම ඉඩම් ලබා දීම සඳහා ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන නීත්‍යානුකූල ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1661/'11

ගරු ඊ. සරවනපවන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, නාගර් කෝවිල් ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කොට තිබේද;

(ii) එසේ නම්, එම සංවර්ධන ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව කොපමණද;

(iii) 2010 වර්ෂය සඳහා වූ ආර්ථික ප්‍රගති වාර්තාව අනුව නාගර් කෝවිල් වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වෙන්කළ රුපියල් මිලියන 5.8 සිදුවූයේ කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1669/'11

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ විදේශ තෙල් සමාගම් කවරේද;

(ii) එම සමාගම් අයිති රටවල් කවරේද;

(iii) එම විදේශ තෙල් සමාගම් ක්‍රියාත්මකව තිබීම නිසා මෙරටට සිදුවූ බලපෑම් කවරේද;

(iv) එම සමාගම් ජනසතු කරනු ලැබූ වර්ෂය කවරේද;

(v) ඒ සඳහා ක්‍රියා කරන ලද රජය කවරේද;

(vi) තෙල් සමාගම් ජනසතු කිරීම නිසා මෙරටට ඇති වූ විදේශීය බලපෑම් කවරේද;

(vii) එම බලපෑම් සමනය කිරීම සඳහා එවකට පැවති රජය ක්‍රියා කරන ලද ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1701/'11

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඇගයීමට ලක්වන විෂයන් කවරේද;

(ii) එම එක් එක් විෂයන් සඳහා දෙනු ලබන සමර්ථයන් වර්ග කවරේද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ එම විභාගයේ එක් එක් විෂයය සඳහා ඉහත සඳහන් සමර්ථයන් ලබාදීමේදී පදනම්කරගත් ලකුණු සීමාවන් කවරේද;

(iv) පසුගිය වර්ෂ පහ තුළ එම විභාගයේ ඒ ඒ විෂයන් සඳහා ලබා ගත් එක් එක් සමර්ථයන් සංඛ්‍යාව හා ප්‍රතිශතයන් වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0586/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) නිදහස ලබාගත් දා සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා රජය වෙනත් රටවලට ඉඩම් තෑගි ලෙස ලබාදී තිබේද;

(ii) එසේ නම්, ලබා දෙන ලද ඉඩම්වල ප්‍රමාණය පර්චස් හෝ අක්කර කොපමණද;

(iii) එසේ ඉඩම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) එසේ මෙරට ඉඩම් ලබා දුන් රටවලින් ඒ අයුරින්ම තෑගි ලෙස ඉඩම් ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

(v) එසේ නම්, එම ඉඩම් ලබා දුන් රටවල නම්, ඒවා ලබා දුන් දිනයන් සහ එසේ ලැබුණු ඉඩම්වල ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1204/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2000 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළට නීති විරෝධී අන්දමින් රැගෙන ඒමේදී අත්අඩංගුවට පත් වූ මත් ද්‍රව්‍ය (හෙරොයින් වැනි) ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නීති විරෝධී මත් ද්‍රව්‍ය මෙරටට ගෙන්වන ලද පුද්ගලයින්ගේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) නීති විරෝධී මත්ද්‍රව්‍ය රැගෙන ඒම සම්බන්ධව එම එක් එක් පුද්ගලයාගෙන් හෝ ආයතනයෙන් රජය විසින් අය කර ගන්නා ලද දඩ මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම මත්ද්‍රව්‍ය ගෙන්වා ඇති රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1360/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොදු පහසුකම් මණ්ඩලය මගින් කොළඹ දිස්ත්‍රික්කයේ, මාලිගාවත්ත මහල් නිවාස සංකීර්ණය නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් එහි නිවැසියන් දැඩි සෞඛ්‍යමය ගැටලුවලට මුහුණපාන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නිවාස සංකීර්ණය නිසි පරිදි නඩත්තු නොකිරීමට හේතු කවරේද;

(ii) නඩත්තු කටයුතු කඩිනමින් ආරම්භ කර නිවැසි ජනතාවගේ සෞඛ්‍යය සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1485/'11

ගරු අජිත් කුමාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1662/'11

ගරු ඊ. සරවනපවන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වර්ෂ 2010 ජූනි මාසයට පසුව උතුරු පළාත තුළ මානසික සෞඛ්‍යයට අදාළව කුමන හෝ ක්‍රියාකාරකමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එවැනි ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2010 ජූනි මාසයෙන් පසුව උතුරු පළාතේ සිය දිවි හානි කර ගැනීමේ ප්‍රතිශතය වැඩි වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) උතුරු පළාත තුළ සියදිවි හානිකර ගැනීම් වැඩිවීමට අදාළ තොරතුරු කවරේද;

(ii) සියදිවි හානිකර ගැනීමේ ප්‍රවනතාව වැඩිවීම වළකාලීම සඳහා විශේෂිත පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) එවැනි විශේෂිත පියවර ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1670/'11

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂයේ පැවති අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයන්ට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව දිස්ත්‍රික් පදනමින් හා එක් එක් භාෂා මාධ්‍ය පදනම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විශ්වවිද්‍යාලවලට ඇතුළු කර ගන්නා සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙරට විශ්වවිද්‍යාල සිසුන්ට විදේශ විශ්වවිද්‍යාලවලට ඇතුළුවීම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් හෝ වෙනත් ක්‍රමවේදයක් දැනට ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි ගුණාත්මක තත්ත්වය නැංවීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ගයන් කවරේද;

(ii) ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1702/'11

ගරු අනුර දිසානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු උණ වැළඳුණු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 වර්ෂය තුළ ඩෙංගු රෝගයෙන් මියගිය රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඩෙංගු වසංගතය මැඩලීම සඳහා කියුබාවෙන් බැක්ටීරියා විශේෂයක් ගෙන්වනු ලැබුවේද;

(iv) එසේ නම්, එය නියමිත කාලය තුළදී ගෙන්වනු ලැබුවේද;

(v) කියුබාවේ සිට ගෙන්වීමේදී එය භාවිතයට නොසුදුසු තත්ත්වයට පත් වූයේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වගකිවයුතු අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 17 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1064/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009, 2010 වර්ෂවලදී සහ 2011 වර්ෂයේ මේ දක්වා ලැබී ඇති සමස්ත ණය සහ ප්‍රදානයන්ගේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් අයුරින් ලැබුණු ණය සහ ප්‍රදානයන් යොදගනු ලැබූ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අයුරින් ලබාගත් එක් එක් ණය මුදලට අදාළව,

(i) සියල්ල ඇතුළත් සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(ii) ණය කාලසීමාව කොපමණද;

(iii) ණය කාලසීමාව අවසානයේදී ගෙවා ඇති සමස්ත පොලිය සහ ණය ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දෙහිවල පිහිටි සත්වෝද්‍යානය පින්නවල වෙත රැගෙනයාමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට එම ඉඩම් අත්පත් කරගෙන තිබේද;

(iv) දෙහිවල පිහිටි සත්වෝද්‍යානය පින්නවල වෙත මාරු කිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(v) ඉහත ස්ථාන මාරුව සිදුකිරීමට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යෝජිත සත්වෝද්‍යාන ස්ථාන මාරුව දැනට හුරු වී ඇති පාරිසරික තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයකට සතුන් නිරාවරණය කිරීමකට හේතුවන බවත්;

(ii) එම තත්ත්වය නිසා සත්වෝද්‍යානයේ සතුන්ගේ ජීවිත අවදානමට ලක්වන වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) සත්වෝද්‍යානයේ ස්ථාන මාරුව නිසා ඇතිවන ඉහත අවදානම් තත්ත්වය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1361/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන ගාල්ල හිරිඹුරාව කනිෂ්ඨ විද්‍යාලය වර්ෂ පහක පමණ කාලයක සිට වසා දමා ඇති බවත්;

(ii) මේ වන විට එම පාසලට අයත් සියලු ගොඩනැගිලි දිරාපත්වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) හිරිඹුරාව කණිෂ්ඨ විද්‍යාලය ඉහත පරිදි වසා දැමීමට හේතු වූ කරුණු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගාල්ල, හිරිඹුරාව කනිෂ්ඨ විද්‍යාලය ප්‍රතිසංස්කරණය කර ප්‍රදේශයේ දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා නැවත විවෘත කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම පාසල නැවත විවෘත කරන දිනය කවරේද;

(iii) නොඑසේ නම්, වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා එම පාසල යොදා ගැනීමේ සැලසුමක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1487/'11

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් සේවා අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1667/'11

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ විදේශීය ගුවන් විදුලි සේවාවන් කවරේද;

(ii) ඒවායින් මෙරටට ඇති වූ බලපෑම් කවරේද;

(iii) එම ගුවන් විදුලි සේවාවන් ඉවත් කිරීම සඳහා කටයුතු කරනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා ක්‍රියාත්මක වූ රජය කුමක්ද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලැබූ වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී විදේශීය ගුවන් විදුලි සේවාවන් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යාම සඳහා අනුමතිය ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම අනුමතිය ලබා දෙන පදනම කවරේද;

(iii) එවැනි පදනමක පිහිටුවා කටයුතු කිරීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1703/'11

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුතුරාජවෙල - දියඹ මුහුදේ තෙල් නල එළීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ අරමුණ කුමක්ද;

(iii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන සමාගම තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ සමාගම් සහ එක් එක් සමාගම විසින් ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(v) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

1715/'11

ගරු තිස්ස අත්තනායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැලියගොඩ හතර කණුවේ සිට බියගම පාරේ කැළණිය පන්සල දක්වා මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් එම මාර්ගය දෙපස ඇති නිවාස හා තාප්ප කිසිදු වන්දි මුදලක් නොගෙවා බලහත්කාරයෙන් කඩා දැමීම සම්බන්ධයෙන් එම ප්‍රදේශයේ ජනතාව විරෝධය පළ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර්ගය පුළුල් කිරීම වැනි ජාතික අවශ්‍යතාවයක් වෙනුවෙන් පවරා ගනු ලබන ඉඩම් සඳහා සාධාරණ වන්දි මුදලක් ලබා ගැනීමටත්, ලබා දෙන වන්දිය පිළිබඳව තෘප්තිමත් නොවන්නේ නම්, අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමටත් අදාළ දේපල හිමියන්ට අයිතිය ඇති බවත්;

(ii) ඉහත සඳහන් මාර්ගය පුළුල් කිරීමේදී ජනතාවගේ කිසිදු අයිතියකට ගරු නොකරමින් සහ දැනුම් දීමකින් තොරව හමුදාව සහ පොලීසිය යොදවා නිවාස හා තාප්ප කඩා දැමීම, පවතින නීතියට පටහැනිව රාජ්‍ය බලය යෙදවීමක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් අගතියට පත් පාර්ශවයන්ට සාධාරණ වන්දි මුදලක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 19 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1063/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියා සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහාවූ ජපාන බැංකුව සහ යුරෝපා සංගමය යනාදී රටවල් සහ ආයතන විසින් පසුගිය වර්ෂ 15 තුළ ලබාදී ඇති ණය හෝ ප්‍රදාන වෙනුවෙන් එකී ණය මුදල් හෝ ප්‍රදානයන් ගෙවා නිමවෙන දිනය වන විට ගෙවිය යුතු සමස්ත මුදල් ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී ණය මුදල් ආපසු ගෙවීමේ සාමාන්‍ය කාලසීමාව එක් එක් රට හෝ ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1488/'11

ගරු අජිත් කුමාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1555/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෑලියගොඩ නව මාළු වෙළඳපොළේ ඇති තොග සහ සිල්ලර මාළු වෙළඳ කුටි සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෙළඳ කුටි ලබා ගත් අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) පෑලියගොඩ නව මාළු වෙළඳපොළෙහි වෙළඳ කුටි ලබාගත් අය අතුරින් ශාන්ත ජෝන් මාළු වෙළඳපොළේ වෙළඳ කුටි ලබා ගෙන සිටි අයගේ නම් කවරේද;

(ii) ශාන්ත ජෝන් මාළු වෙළඳපොළේ වෙළඳ කුටි හිමිව නොසිටි නමුත් පෑලියගොඩ නව මාළු වෙළඳපොළේ වෙළඳ කුටි ලබාගෙන ඇති අයගේ නම් කවරේද;

(iii) ඔවුන්ට එම අවස්ථාව ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1569/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන ඌරුබොක්ක කණිෂ්ඨ විද්‍යාලයේ ගුරු නිවාසය දුර බැහැර සිට සේවයට පැමිණෙන ගුරුවරුන්ට නේවාසික පහසුකම් සළසන බවත්;

(ii) මේ වන විට එම ගුරු නිවාසය දැඩි ලෙස අබලන්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම් , එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1730/'11

ගරු අනුර දිසානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ හිමිකාරීත්වය රජය සතුද;

(ii) එම අමාත්‍යාංශ ගොඩනැගිල්ල 2010 හෝ 2011 වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණය කරනු ලැබූ කොටස් කවරේද;

(iv) ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම සඳහා තෝරාගත් සමාගම කවරේද;

(v) එම සමාගම තෝරා ගැනීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(vi) ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1736/'11

ගරු පාලිත රන්ගෙ බණ්ඩාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම විවිධසේවා සමූපකාර සමිතිය මගින් 2009 වර්ෂයේදී ලොතරැයි අලෙවි කිරීමක් සිදුකළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ලොතරැයිය වෙනුවෙන් මුද්‍රණය කළ ටිකට්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) එයින් අලෙවි කළ ටිකට්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලොතරැයි අලෙවි කිරීමෙන් ලද මුළු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ලොතරැයි අලෙවියට අදාළව දිනුම් ඇදීම සිදුකර තිබේද;

(ii) එසේ නම්, එහි ජයග්‍රාහකයන් කවුරුන්ද;

(iii) දිනුම් ඇදීමක් සිදු කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) මෙතෙක් දිනුම් ඇදීමක් සිදු නොකිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම් මන්ද?

1845/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් වගාව ඉහල නැංවීම සඳහා ග්‍රාමීය මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) එම වැඩසටහන් යටතේ පොල් වගාකරුවන්ට ලබාදෙන සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 20 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1209/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මේ දක්වා ලියාපදිංචි කර බලපත්‍ර ලබා දී ඇති මූල්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මූල්‍ය ආයතනවල නම් කවරේද;

(iii) මහ බැංකුව වෙත වාර්තා වී ඇති ලියාපදිංචි නොවී පවත්වාගෙන යනු ලබන මූල්‍ය ආයතන තිබේද;

(iv) එසේ නම්, ඒවායේ නම් කවරේද;

(v) එම ලියාපදිංචි නොකළ මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1308/'11

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා දරන මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා මිළ කොපමණද;

(iii) ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබාගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළඹී පුද්ගල සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

යන්න සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1495/'11

ගරු අජිත් කුමාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශය අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1584/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල-වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ, කුඹුක්කන ගංගාරාම විහාරස්ථානය සමීපයෙන් ගලායන දියපාර හරහා ඉදිකර තිබූ පාලම පුළුල් කිරීම සඳහා කඩා දමා මාස ගණනාවක් ගතවී ඇතත් එහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භකර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නව පාලමේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලම ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එක් එක් ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ මිල ගණන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) විදේශ ආධාර මගින් ලබා ගත්තේ නම්, එම ආධාර ලබා දුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1733/'11

ගරු අනුර දිසානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ වත්මන් නිෂ්පාදන ධාරිතාවය කොපමණද;

(ii) විවෘත කළ දින සිට එම බලාගාරය මගින් අඛණ්ඩව විදුලි සැපයුමක් ලබා දෙන්නේද;

(iii) එම බලාගාරය වසා දමා හෝ අක්‍රිය තත්ත්වයෙන් පැවති දින ගණන කවරේද

(iv) එම තත්වයට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1814/'11

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව සඳහා ඉදිකළ නව ගොඩනැගිල්ල 2011.07.05 දින විවෘත කළ බවත්;

(ii) ඒ වන විට, එම ප්‍රාදේශීය සභාවේ අභිනව පාලනාධිකාරිය දිවුරුම් දී නොතිබූ බැවින් විශේෂ කොමසාරිස් ලෙස බලතල පැවරී තිබූ ප්‍රාදේශීය ලේකම්තුමියගේ වගකීම යටතේ එම විවෘත කිරීම කළ බවත්;

(iii) අභිනව පාලනාධිකාරිය දිවුරුම් දී නොමැති අවස්ථාවක එම විවෘත කිරීමේ උත්සවය පැවැත්වීම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එය කල් තබන ලෙස දෙන ලද උපදෙස් නොසලකා හැරීමක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යම් ප්‍රාදේශීය ලේකම්වරයෙකුට අමාත්‍යාංශ ලේකම්වරයකු විෂයානුබද්ධිතව ලබා දෙන උපදෙස් නොසලකා හරිමින් කටයුතු කිරීමට බලයක් තිබේද;

(ii) නොඑසේ නම්, ඉහත පරිදි ක්‍රියා කළ ත්‍රිකුණාමලය නගර හා කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්ට එරෙහිව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1844/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රබර් වගාව දියුණු කිරීම සඳහා කුඩා රබර් ඉඩම් හිමියන්ට සහනාධාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, ඒ යටතේ ඉඩම් හිමියන්ට ලබාදෙන සහනාධාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 දෙසැම්බර් මස 21 වැනි බදාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0562/'10

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියරේ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

(ii) එකී කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන්ද;

(iii) එසේ නම්, එම ටෙන්ඩර්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කරන දිනය සහ අවසන් කරන දිනය කවරේද;

(ii) ඒ සඳහා මුදල් සම්පාදනය කරන්නේ කෙසේද;

(iii) පොලිය සහ ඉදිකිරීම් වියදමට අනුව සම්පූර්ණ පිරිවැය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ හය සඳහා වූ මුදල් ප්‍රවාහය පිළිබඳ පුරෝකථනය කවරේද;

(v) ප්‍රාග්ධනය සහ පොලිය සඳහා වන වියදම ද, අනෙකුත් මෙහෙයුම් වියදම් ද, ඉදිරි වර්ෂ දහය තුළ එක් එක් වර්ෂයේ දී ලැබීමට නියමිත ආදායම් ද ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ වරායෙන් ලැබෙන ආදායම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය ගෙවීම සඳහා යොදා ගන්නේද;

(ii) ණය මුදල ආපසු ගෙවීම ආරම්භවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1362/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ කරදන සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොටසක් කඩා ඉවත්කර නැවත අත්තිවාරම් දමා ඇතත්, ඉතිරි ඉදිකිරීම් කටයුතු මේ වන විට නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කර ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) ප්‍රතිපාදන වෙන් කර තිබේ නම්, එම මුදල කොපමණද;

(iv) ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භකරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1496/'11

ගරු අජිත් කුමාර මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1557/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ මැයි දිනය සැමරීම සඳහා සහභාගී වූ ජනතාව ප්‍රවාහනය කිරීමට රජය විසින් ශ්‍රී ලංගමයේ එක් එක් ඩිපෝවෙන් ලබා ගත් බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ වෙනුවෙන් එක් එක් ඩිපෝවට රජය ගෙවා ඇති මුදල කොපමණද;

(iii) එම බස් රථ සඳහා මුදල් ගෙවා නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 මැයි දින සැමරුම සඳහා රජය විසින් ශ්‍රී ලංගමයෙන් ලබා ගත් බස් රථ සඳහා මුදල් මේ වන විට ගෙවා අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1613/'11

ගරු ඊ. සරවනපවන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චිය අධ්‍යාපන කලාපයේ සේවයේ යෙදිය යුතු අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට කිලිනොච්චිය අධ්‍යාපන කලාපයේ සේවයේ නියතු අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම අධ්‍යාපන කලාපයේ දැනට පවතින අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිලිනොච්චිය අධ්‍යාපන කලාපය සඳහා අනුමත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II, සහ III ශ්‍රේණිවලට අදාළ විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II, සහ III ශ්‍රේණිවලට අදාළ විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අනුමත සේවක සංඛ්‍යාවට අනුව සිටිය යුතු එක් එක් ශ්‍රේණියේ විදුහල්පතිවරු සංඛ්‍යාව එම අධ්‍යාපන කලාපයට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1804/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය, කෝන්ගහගෙදර සිට පූගල්ල දක්වා මාර්ගයේ කාපට් ඇතිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මාර්ගය කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවන් කවරුන්ද;

(iv) එම එක් එක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1909/'11

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියා සඳහා මැද පෙරදිග රටවලට යන බොහෝ ශ්‍රමිකයන්ට එම රටවල ක්‍රියාත්මක වන ෂරියා නීතිය සහ අනෙකුත් නීති රීති පිළිබඳව දැනුවත්භාවයක් නොමැති බවත්;

(ii) එම හේතුව නිසා විදේශ රැකියාවල යෙදීමේදී ඔවුන්ට විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මැදපෙරදිග රටවල නීති රීති පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් එම රටවල නීතිය යටතේ වරදකරුවන් වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්හට නීති ආධාර ලබා ගැනීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දී එම ශ්‍රමිකයන්ට ඇතිවන ගැටලු මගහැරවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?